**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල - 2018**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තව ද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

--------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවල දී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ගිණුම් ඉදිරිපත් කිරීමේ හා පවත්වා ගැනීමේ අඩුපාඩු

--------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණ භාවිතාව අනුව සාමාන්‍යයෙන් ඉතිරිකිරීමේ ගිණුමක ශේෂය හා ඊට අදාළ මුදල් පොත් ශේෂය වෙනුවෙන් බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල නොකරන නමුත් අරමුදල වෙනුවෙන් පවත්වා තිබුණු ඉතිරිකිරීම් ගිණුම වෙනුවෙන් බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කර තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | පොදුවේ පිළිගත් ගිණුම්කරණ ක්‍රමවේදයන්ට අනුකූලව කටයුතු කිරීම. |
| (ආ) | බැංකු ජංගම ගිණුම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව, රු.709,782 ක මුදලක් ඉතිරි කිරීමේ ගිණුමකට මාරු කළ බවට දක්වා තිබුණද, එවැනි මුදල් මාරු කිරීමක් ඉතිරිකිරිම් ගිණුමේ පාස් පොත අනුව නිරීක්ෂණය නොවීය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශවල අගයන් ප්‍රභව ලියවිලි සමඟ සැසඳෙන සේ සටහන් තැබීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ලෙජරයේ පැවති වෙනත් ආදායම් ගිණුමේ ශේෂය එක් පිටුවක සිට තවත් පිටුවකට ගෙන යාමේදී රු.6,100 ක් වැඩියෙන් සටහන් කර තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ගිණුම්වල ශේෂයන් නිවැරදි ලෙස පිටපත් කළ යුතු වීම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉතිරි කිරීම් ගිණුම මත ලද පොලී රු.මිලියන 6.70 ක් භාණ්ඩාගාර බැඳුම්කර පොලී ලෙස මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | නිවැරදි ලෙස ආදායම් ප්‍රභවයන් අනාවරණය කිරීම. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | | |
| (අ) | ආදායම් ප්‍රකාශනය අනුව, සේවා වියදම් ගිණුමේ ශේෂය රු.198,330 ක් වුවද, ඊට අදාළ සටහන්වල එය රු.207,701ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.9,371 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. | 198,330 | 207,701 | 9,371 | පිළිතුරු ලබා දී නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල අගයන් හා ඊට අදාළ සටහන්වල අගයන් එකිනෙකට සැසඳෙනසේ ගිණුම් පොත් පවත්වාගෙන යාම. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට ඉතිරි කිරීම් ගිණුමක පාස් පොත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සමඟ එකඟ කිරීමේදී රු.709,782 ක වෙනසක් නිරීක්ෂණය විය. | 245,579,619 | 246,289,401 | 709,782 | පිළිතුරු ලබා දී නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශවල සඳහන් අගයන් ඊට අදාළ ප්‍රභව ලියවිලි වල සඳහන් අගයන් සමඟ සැසඳෙන අයුරින් ගිණුම් පොත්පත් පවත්වා ගැනීම. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වැටුප් වියදමට අදාළව ලෙජරයේ පැවැති වටිනාකම හා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ පැවැති වටිනාකම අතර රු.95,225 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. | 3,411,314 | 3,316,089 | 95,225 | පිළිතුරු ලබා දී නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශවල සඳහන් අගයන් සහ ඊට අදාළ ලෙජර් ගිණුම්වල ශේෂයන් එකිනෙකට සැසඳෙන අයුරින් ගිණුම් පොත්පත් පවත්වාගත යුතු බව. |
| (ඇ) | අරමුදලේ ගනුදෙනු වෙනුවෙන් පවත්වා ගෙන ගොස් තිබුණු බැංකු ජංගම ගිණුම හා ඉතිරි කිරීමේ ගිණුම අතර මුදල් හුවමාරු කිරීමට අදාළව සිදුකළ විගණන පරික්ෂාවකට අනුව, අවස්ථා 33 ක දී එකතුව රු.මිලියන 16 ක වෙනස්කම් පැවැති බව නිරීක්ෂණය විය. එම වෙනස්කම් සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. | - | - | 16,033,632 | | බැංකු ගිණුම් දෙක අතර ගනුදෙනු විධිමත් පරිදි පොත්වල සටහන් කළ යුතු වීම. |

### 1.5.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලද අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත වාහන වායු විමෝචන පරික්ෂණ භාරකාර අරමුදල වසා දැමීමට තීරණය කළ බව භාණ්ඩාගාර ලේකම්ගේ අංක 02/2018 හා 2018 අගෝස්තු 18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි තහවුරු විය. කෙසේ නමුත් චක්‍රලේඛය පරිදි ඇවරකරුවෙකු පත්කර වත්කම්වලින් වගකීම් නිරවුල්කර ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට 2019 මැයි 15 දිනවන විටත් කටයුතු කර නොතිබුණි. අරමුදල සතු තැන්පතු ප්‍රමාණය පමණක් රු.මිලියන 711 ක් වූ අතර භාර ඔප්පුවක් යටතේ ස්ථාපනය කර තිබුණු මෙම අරමුදලෙහි දෙපාර්ශවයෙන් භාණ්ඩාගාර ලේකම්වරයා එක් පාර්ශවයක් විය. අරමුදල ස්ථාපනය | පිළිතුරු ලබා දී නොතිබුණි. | අදාළ නෛතික පරිසරය තුළ අවශ්‍ය කටයුතු ඉටු කිරීම. |

කළ භාර ඔප්පුවේ 11 (අ) ඡේදය පරිදි, භාණ්ඩාගාර ලේකම්වරයාගේ ප්‍රකාශය මත මෙම අරමුදල අහෝසි වේ. ඒ අනුව, ඉහත චක්‍රලේඛය භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කිරීම මත මේ වන විටත් අදාළ ගිවිසුම්ගත බැඳීමෙන් එක් පාර්ශවයක් ඉවත්ව ඇත. මේ නිසා අරමුදල පැවතීමේ නීත්‍යානුකූලභාවය ද ගැටළු සහගත විය.

## 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ විවිධ ආදායම් යටතේ රු.530,125 ක ආදායමක් පෙන්නුම්කර තිබුණද, ඉන් රු.453,725ක් හඳුනා ගැනීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | හඳුනා නොගත් ආදායම් පිළිබඳ තහවුරු සාක්ෂි | පිළිතුරු ලබා දී නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් අගයන් සනාථ කෙරෙන සාක්ෂි ප්‍රමාණවත් ලෙස පවත්වා ගැනීම සහ විගණනය සඳහා ඉදිරිපත් කිරීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 396 (ඇ) | අංක 119 – 2 – 001 – 3 0007394 දරන ජංගම ගිණුම අනුව නිකුත් කරන ලද නමුත් මාස 06කට වැඩි කාලයක් පසු වී ඇති ගෙවීමට ඉදිරිපත් නොවූ රු.70,500 ක චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු නොකිරීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | **අංක PF/423 හා 2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය** | | | |
| (i) | 03.2 (ආ) ඡේදය | අරමුදල සතු රු.මිලියන 711 ක ස්ථාවර තැන්පතු 03 ක් ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමේ හැකියාව පිළිබඳව සොයාබලා නොතිබීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. | චක්‍රලේඛය පරිදි අතිරික්ත මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමේ හැකියාව සොයාබලා කටයුතු කළ යුතුවීම. |
| | | අරමුදල සතු ඉතුරුම් තැන්පතු ගිණුමේ මාසිකව රු.මිලියන 239.68 ක සාමාන්‍ය ශේෂයක් පැවැති බව සමාලෝචිත වර්ෂයේ මාස 12 නියැදියක් ලෙස ගෙන සිදු කළ පරීක්ෂාවකට අනුව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | චක්‍රලේඛය පරිදි අතිරික්ත මුදලක් වේ නම් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට ඇති හැකියාව සොයාබලා ඒ අනුව කටයුතු කිරීම. |
| (ii) | 4.3 ඡේදය | • ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත අදාළ මුදල් වර්ෂය වෙනුවෙන් අරමුදල සඳහා කාර්යසාධන වාර්තා පිළියෙල කර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපත් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එවැනි කාර්යසාධන වාර්තාවක් 2019 මැයි 17 දින වනතුරුත් පිළියෙල කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කිරීමට පියවර ගැනීම. |
| | | • ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත විගණනය සඳහා විගණකාධිපති වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවද, එම කාලය ඉකුත් වී දින 27 ක ප්‍රමාදයකින් පසුව ගිණුම් ඉදිරිපත් කර තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කිරීමට පියවර ගැනීම. |
| (iii) | 4.2 (ඇ) ඡේදය | අරමුදල සඳහා වෙනම බැංකු ගිණුමක් සහ පොත්පත් පවත්වාගෙන යන්නේ නම්, එම ගිණුම් නිතිපතා සසඳා ප්‍රගතිය පිළිබඳ | පිළිතුරු ලබා දී නොතිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කිරීමට පියවර ගැනීම. |

| | | |
|---|---|---|
| | එක් එක් කාර්තුව සඳහා වූ වාර්තා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මේ දක්වාම එවැනි වාර්තා කිසිවක් සකස් කර අදාළ පාර්ශව වෙත යොමුකර නොතිබුණි. | |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 305.89 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 187.36 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 118.53 ක වර්ධනයක් නිරීක්ෂණය විය. වර්ෂයේ ආදායම රු.මිලියන 96.18 කින් වැඩි වීමත්, වර්ෂයේ වියදම රු.මිලියන 22.35 කින් අඩු වී තිබීමත් මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වායු විමෝචන භාරකාර අරමුදලේ ගිවිසුම අනුව, පාලක මණ්ඩල රැස්වීම් මාස 03කට වරක් පැවැත්විය යුතුය. එහෙත් 2018 වර්ෂය තුළ පාලක මණ්ඩල රැස්වීම් 03ක් පමණක් පවත්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | පවතින නීති, රීතිවලට අනුකූලව කටයුතු කර අරමුදලේ කටයුතු පහසුකරවා ගැනීම. |

**3.2 කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වායු විමෝචන පරීක්ෂණ සිදු කරන පුද්ගලික ආයතන 02ක් මගින් සමාලෝචිත වර්ෂයේදී වාහන 4,875,767 ක් සඳහා දුම් සහතික නිකුත් කර තිබුණද, අරමුදල මගින් මාර්ගස්ථ හා ස්ථානීය පරීක්ෂණ සිදුකර පැවැතියේ එම දුම් සහතික නිකුත් කළ වාහන 7203 ක් සඳහා පමණි. එය දුම් සහතික නිකුත් කළ වාහනවලින් සියයට 0.15 ක් වැනි ඉතා අවම අගයක් විය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | පරීක්ෂණ සඳහා ප්‍රමාණවත් නියැදියක් තෝරාගෙන අදාළ පරීක්ෂණ කටයුතු සිදුකර අරමුදලේ අරමුණු සඳහා ඉහළ දායකත්වයක් ලබාදිය යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) වායු විමෝචන භාරකාර අරමුදලේ අරමුණු ඉටු කිරීම වෙනුවෙන් වායු විමෝචන පර්යේෂණ සඳහා බාහිර පාර්ශව වෙත ගෙවීම් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් අනාවරණය වූ කරුණු පහත පරිදි විය. | | |
| (i) වායු විමෝචන පරීක්ෂණ දෙකක ගිවිසුම්ගත වූ කාල පරිච්ඡේදය 2017 වර්ෂයේ අවසන් වී තිබුණද, ඊට අදාළ වාර්තා 2019 මැයි 17 දින වනතුරුත්, අරමුදල වෙත ඉදිරිපත් කර නොතිබුණි. මේ නිසා එම පර්යේෂණ ප්‍රතිඵලවල කාලීන වැදගත්කම අඩුවීම, උනන්දු වන පාර්ශවයන්ට එම දත්ත ලබාගැනීමට නොහැකි වීම මෙන්ම, එම පර්යේෂණ ප්‍රතිඵල මත ඉදිරිපත් වන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබීම ආදී කරුණු මත මෙම පර්යේෂණ වෙනුවෙන් වැය කළ රු.මිලියන 21.65 ක් නිශ්ඵල වියදම් ලෙස නිරීක්ෂණය විය. එමෙන්ම අවසාන වාර්තාව ඉදිරිපත් කිරීමට පෙර ගිවිසුම්ගත සියලු මුදල් ගෙවා අවසන් කිරීම මතභේදයට තුඩුදෙන කරුණක් විය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | දරන ලද වියදම මඟින් අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයවීම. |
| (ii) තවත් වායු විමෝචන පර්යේෂණ 02 ක් වෙනුවෙන් පර්යේෂණ වාර්තා 2017 වර්ෂය තුළදී අරමුදල වෙත ඉදිරිපත් කර තිබුණද, ඒවායේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට 2019 මැයි 17 දින වනතුරුත්, පියවර ගෙන නොතිබුණි. අවශ්‍ය පරිදි වගකිව යුතු පාර්ශව දැනුවත් කරමින් අදාල නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම නිසා වායු දූෂණය අඩුකර වායු තත්ත්වය වැඩි දියුණු කිරීම හා රෝග ඇතිවීම වැළැක්වීම වැනි අරමුදලේ අරමුණු ඉටු වී නොතිබුණි. එම නිර්දේශ ක්‍රියාත්මක කරන තෙක් ඒ වෙනුවෙන් දරන ලද රු.මිලියන 1ක මුදල නිශ්ඵල වියදමක් ලෙස ද නිරීක්ෂණය කෙරේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. | දරන ලද වියදම මඟින් අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයවීමේ අවශ්‍යතාවය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල වෙනුවෙන් වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් ද ප්‍රමාණවත් විගණනයක් සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | විධිමත් පරිදි අභ්‍යන්තර විගණනයක් සිදු කිරීම. |

### 4.2 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විවිධි ණයහිමි ගෙවීම් සඳහා රු.461,000 ක් අයවැය මගින් වෙන් කර තිබුණද, සත්‍ය ගෙවීම රු. මිලියන 132.01 ක් වූයෙන් අයවැයගත වටිනාකමට සාපේක්ෂව සිදුකර තිබුණු ඌන වෙන් කිරීම සියයට 28,636 කි. මේ අනුව අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | තාත්වික ලෙස අයවැය සංඛ්‍යා තීරණය කිරීම. |
| (ආ) | වැය විෂයයන් 04 ක් සඳහා වාර්ෂික අයවැය ලේඛනය මගින් රු. මිලියන 653.4 ක වෙන් කිරීමක් සිදුකර තිබුණ ද, එවැනි වියදම් කිසිවක් වර්ෂය තුළ සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | තාත්වික ලෙස අයවැය සංඛ්‍යා තීරණය කිරීම. |